**කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක. 21**

මගේ අංකය: ඩීඑම්එස්/වැටුප්/පොදු,
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.
2004 ජනවාරි මස 02 දින.

සියළුම: අමාත්‍යාංශ ලේකම්වරුන්, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් සභාපතිවරුන් වෙතය.

## රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවක වැටුප් වැඩිකිරීම.

2004 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ සේවකයින්ගේ වැටුප්, ඒ ඒ සේවකයාගේ වැටුපෙන් 10% ක් හෝ රු.1250/=ක් හෝ යන දෙකින් කවරක් හෝ වැඩි ප්‍රමාණයෙන් ඉහල නැංවීමට යෙදුන, 2003.12.30 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 15/2003 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ.

02. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවයෙහි නිරත සහ පාරිභෝගික මිල දර්ශකය හා සම්බන්ධිත විචල්‍ය ජීවන වියදම් දීමනාව නොලබන්නා වූ හෝ වෘත්තීය සංගම්/සේවකයින් සමඟ එළඹ ඇති සාමූහික ගිවිසුම්වලින් ආවරණය නොවන්නා වූ සේවකයින් වෙත ද එම වැඩිවීම දීර්ඝ කළ යුතු යැයි රජය තීරණය කර ඇත.

03. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල වැටුප් ව්‍යුහයන් ආයතනයෙන් ආයතනයට වෙනස් වන හෙයින් ඒ ඒ ආයතනයන් තම වැටුප් පරිමාණයන් පහත දැක්වෙන මාර්ගෝපදේශයන්ට අනුකූලව වෙන වෙනම සකසා අදාල අමාත්‍යාංශ ලේකම්වරයා මගින් අනුමතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි උපදෙස් දෙනු ලැබේ. එසේම එවීමත් අනුමතිය නියමාකාරයෙන් ලබා ගෙන මිස මෙම වැඩිවීම නොගෙවිය යුතු යැයි ද උපදෙස් දෙනු ලැබේ.

(අ) මෙම වැටුප් වැඩිවීම ක්‍රියාත්මක කළ යුත්තේ, සෑම සේවකයකුට ම මාසිකව රු. 1250/=ක් හෝ 1997 වැටුප් ප්‍රතිශෝධනයෙහි දී වැටුප් සහ සේවක සංඛ්‍යා කමිටුව හෝ භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද වැටුප් පරිමාණයන් පාදක කොටගත් ඔහුගේ /ඇයගේ වර්තමාන මාසික වැටුපෙන්(සියළු දීමනා අතහැර) 10% හෝ යන දෙකින් වඩා ඉහළ වැඩිවීම ලැබෙන බව සහතික වන පරිද්දෙනි.

(ආ) කිසියම් තනතුරක වැටුප් පරිමාණය, අමාත්‍ය මණ්ඩල තීරණයක් හෝ භාණ්ඩාගාර අනුමතියක් මත කලින් වැඩි කරනු ලැබ ඇත්නම් සහ එසේ වැඩි කරන ලද වැටුප් පරිමාණය, දැනට යෝජිත වැටුප් පරිමාණයට වඩා ඉහළ මට්ටමක පවතී නම් එවිට, තවදුරටත් කිසිදු වැටුප් ප්‍රතිශෝධනයක් නොකොට, අමාත්‍ය මණ්ඩලය හෝ භාණ්ඩාගාරය විසින් අනුමත කරනු ලැබ ඇති වැටුප් පරිමාණය අඛණ්ඩව ගෙවිය යුතු ය. සේවකයින් විසින් ලබමින් ඇති වැටුප් පරිමාණයන්, අමාත්‍ය මණ්ඩලය හෝ භාණ්ඩාගාරය විසින් අනුමත කැරුන 1997 වැටුප් පරිමාණයන්ට වඩා ඉහළ නමුත් නව වැටුප් පරිමාණයන් ඉක්මවා නොයන අවස්ථාවක, ඔවුන්ගේ වැටුප් පරිමාණ ප්‍රතිශෝධනය කළ යුත්තේ වැටුප් පරිමාණ දෙක අතර වෙනස පමණක් ඔවුනට ලැබෙන පරිද්දෙනි.

(ඇ) 2000-09-11 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 07 සහ 2001-10-18 දිනැති චක්‍රලේඛ අංක. 12 මගින් ගෙවීමට බලය දෙන ලද අතුරු දීමනාවන්, යථෝක්ත වැටුප් වැඩිකිරීමට සමාන්තරව තවදුරටත් නොකඩවා ක්‍රියාත්මක වනු ඇත. 2000 සැප්තැම්බර් මස 11 වැනි දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක. 07 මගින් අනුමත කරනු ලැබ ඇති 10% වැඩි කිරීම 2004.01.01 දින සිට ආගණනය කළ යුත්තේ මෙම ප්‍රතිශෝධිත වැටුප් පදනම් කර ගෙන ය.

(ඇ) ඉහත (ඇ) හි සඳහන් දීමනා හෝ දීමනාවල ඉහල දැමීම්වලට අමතරව 1997.01.01 දිනට පසුව ලබාදෙන ලද දීමනා හෝ දීමනාවල ඉහල දැමීම් කිසිවක් වේ නම්, ඒවා යෝජිත වැටුප් වැඩිවීමෙන් අඩුවිය යුතුය. එසේ වුවත් එකී දීමනා හෝ වැඩිවීම් මෙම චක්‍රලේඛය මගින් ප්‍රදානය කරනු ලබන වැටුප් වැඩිවීමට වඩා ඉහල අගයක් ගනී නම්, 2004.01.01 දින සිට එකී සේවකයන්ට ගෙවිය යුත්තේ එම අගයන් අතර වෙනස පමණකි.

04. නැවත සේවයෙහි යොදවා හෝ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති සේවකයින්ට මෙම චක්‍ර ලේඛයෙහි විධිවිධාන අදාල නොවනු ඇත.

05. මෙම උපදෙස් වැරදි ආකාරයට අර්ථකථනය කිරීම හෝ වැරදි ලෙස ආගණනය කිරීමේ හෝ වෙනත් වැරදි හේතුකොටගෙන හෝ සිදුවන ඕනෑම වැඩිපුර ගෙවීමක්, එය ලද අදාල සේවකයින්ගෙන් අප්‍රමාදව ආපසු අයකරගත යුතු බව සටහන් කර ගත යුතු ය.

06. එසේ වැඩි කරන ලද වැටුප් සඳහා අනුමතිය පතා කෙරෙන ඉල්ලීම් සමඟ පහත අපේක්ෂිත විස්තර තොරතුරු ද අනිවාර්යයෙන් ම ඉදිරිපත් කළ යුතු ය.

I. 1997 වැටුප් ප්‍රතිශෝධනයේදී වැටුප් සහ සේවක සංඛ්‍යා කමිටුව හෝ භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද ලිපිවල පිටපත් ද සමඟ එකී ප්‍රතිශෝධනයන් පිළිබඳ විස්තර
II. 1997-01-01 දිනට පසුව ගෙවන ලද දීමනා පිළිබඳ විස්තර
III. 1997-01-01 දිනට පසුව වැටුප් ප්‍රතිශෝධනයන් සඳහා භාණ්ඩාගාර හෝ අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබී ඇති අවස්ථාවල ඒවාට අදාල බලය දීමේ ලිපිවල පිටපත් (අමාත්‍ය මණ්ඩලය විසින් බලය දෙනු ලැබ ඇති අවස්ථා වලදී, ඊට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශය හා තීරණය)
IV. 2004 වැටුප් වැඩිකිරීම පදනම් කරගෙන දෛනික වැටුප්ලාභී සේවකයින්ගේ වේතන ප්‍රතිශෝධනයන් දැක්වෙන උපලේඛණ.

07. එම ඉල්ලීම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළයුතු අතර ඒවායේ පිටපත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ද යැවිය යුතු ය.

p8. මෙකී වැඩිකරන ලද වැටුප් ගෙවීම, 2004.01.01 දින සිට ක්‍රියාත්මක කිරීම පිළිබඳ තවදුරටත් උපදෙස් , ඉහත 03 ජේදයෙහි සඳහන් අනුමතිය ලබාදීම ගැන දන්වන්නට යෙදෙන ලිපිය මගින් දැනුම් දෙනු ඇත.

09. මෙම චක්‍ර ලේඛයෙහි අන්තර්ගත කරුණු අදාල සියළුම පාර්ශවයන්ට දැනගැනීමට සළස්වා, ඒවා තදින් ම පිළිපදිනු ලබන බව සහතික කරන මෙන් ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

අත්/කළේ : ජේ. චරිත රත්වත්තෙ
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් අමාත්‍යාංශයේ ලේකම්

පිටපත්:- ජනාධිපති ලේකම්,
අග්‍රාමාත්‍ය ලේකම්,
විගණකාධිපති

*C:Priya 05/01/2004.doc*

<u>කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක. 21 සඳහා පරිපූරකය</u>

මගේ අංකය: ඩීඑම්එස්/වැටුප්/පොදු,
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව,
මහා . භාණ්ඩාගාරය,
කොළඹ 01.
2004 ජනවාරි මස 02 දින.

සියළුම: අමාත්‍යාංශ ලේකම්වරුන්, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල .සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් සභාපතිවරුන්, වෙතය.

**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන්**
**<u>රජය සතු සමාගම්වල සේවක වැටුප් වැඩිකිරීම.</u>**

ඒ ඒ ආයතනයන් තම වැටුප් පරිමාණයන්, ලබා දී ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව වෙන වෙනම සකසා අදාල අමාත්‍යාංශ ලේකම්වරයා හරහා අනුමතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි ද විධිමත් අනුමතිය නියමාකාරයෙන් ලබා ගෙන මිස මෙම වැඩිවීම නොගෙවිය යුතු යැයි ද උපදෙස් දෙන්නට යෙදුන, ඉහත කී විෂය පිළිබඳ 2004.01.02 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 21 හි 03 ජේදයට ඔබේ කාරුණික අවධානය යොමු කරවමි.

02. ඒ අනුව, වැඩි කැරුන වැටුප් පරිමාණයන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සංනිරීක්ෂණය කොට අනුමත කිරීම සඳහා තරමක් කල් ගතවන හෙයින්, යථෝක්ත ක්‍රියා මාර්ගය හේතුකොට ගෙන වැඩි කැරුන වැටුප් ගෙවීමෙහි ලා අනිසි ප්‍රමාදයක් සිදුවන බව මගේ අවධානයට ලක් කරනු ලැබ ඇත. එබැවින්, ප්‍රතිශෝධිත වැටුප් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අවසාන වශයෙන් අනුමත කරනු ලබන තෙක්, අදාල වර්තමාන වැටුපෙන් 10% ක් හෝ රු.1250/- ක් හෝ යන දෙකින් කවරක් හෝ වැඩි ප්‍රමාණය අත්තිකාරම් මුදලක් ලෙස 2004 ජනවාරි මාසයේ සිට එකී වැටුප් වැඩිවීමට හිමිකම් ඇති සියලුම සේවකයින්ට ගෙවීමට පියවර ගන්නා ලෙස උපදෙස් දෙනු ලැබේ.

අ/ක. ජේ. චරිත රත්වත්තෙ
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් අමාත්‍යාංශයේ ලේකම්

පිටපත්:- ජනාධිපති ලේකම්,
අග්‍රාමාත්‍ය ලේකම්,
විගණකාධිපති

*C:Priya 05/01/2004.doc*